''පුමිතිරි'' - ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබඳ විද්‍යුත් සඟරාව
Online ISSN: 2394-6792
http://fhss.sjp.ac.lk/pumithiri-journal/
වෙළුම: 2; II කලාපය; 2023 නොවැම්බර්; පිටු: 73-84

# ලංකාවේ ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ ගතිකත්වය පිළිබඳ මානව විද්‍යාත්මක ප්‍රවේශයක්

**එන්. එල්. කේ. සඳුනිකා**
මානව විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
kalaliyanage@gmail.com

**සංක්ෂේපය**

ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ බහුවිධ ගතිකත්වය හෙළිදරව් කිරීමේදී මෙන්ම ස්ත්‍රීපුරුෂ සමානාත්මතාවට, සමාජ සාධාරණත්වය හා අන්තර්ග්‍රහණය පිළිබඳ අඛණ්ඩ කතිකාවතක් ඇති කිරීමේදී මානව විද්‍යාව ප්‍රධාන කාර්යයක් ඉටු කරනු ලබයි. එසේම ඓතිහාසික, සංස්කෘතික හා සමකාලීන සාධක මඟින් ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ භූමිකාවන් අනන්‍යතා හා බල ගතිකත්වය ගොඩනැගී ඇති ආකාරය හෙළිදරව් කිරීමට මානව විද්‍යාඥයන් විසින් පෙළඹී ඇත. ඒ අනුව මානව විද්‍යාත්මක ප්‍රවේශයක් ඔස්සේ ශ්‍රී ලංකාවේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ගතිකත්වය බහුවිධ දෘෂ්ටිකෝණයකින් හැදෑරීම මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වේ. මානව විද්‍යාඥයින් විසින් සංස්කෘතීන් සහ සමාජයන් පුරුෂත්වය සහ ස්ත්‍රීත්වය පිළිබඳ සංකල්ප සකස් කරන ආකාරය මෙන්ම මෙම සංකල්ප ජාතිය, පංතිය, ආගම සහ ලිංගිකත්වය වැනි අනෙකුත් සමාජ මානයන් සමඟ ඡේදනය වන ආකාරය අධ්‍යයනය කරයි. ගෝලීයකරණය, නාගරීකරණය හා සමාජ වෙනස්කම් හේතුවෙන් ශ්‍රී ලංකාවේ ස්ත්‍රීපුරුෂ සමාජභාවයේ සැළකිය යුතු වෙනස්කම් සිදුවෙමින් පවතී. සාම්ප්‍රදායික ස්ත්‍රීපුරුෂ සමාජභාවයට අභියෝග කරමින් ශ්‍රම බලකාය, අධ්‍යාපනය හා දේශපාලනය සඳහා කාන්තා සහභාගීත්වය වැඩි වී ඇත. අධ්‍යාපනය සහ රැකියාව වැනි ක්ෂේත්‍රවල පූර්ණ ස්ත්‍රීපුරුෂ සමානාත්මතාවය සාක්ෂාත් කර ගැනීමේ අභියෝග පවතී. අධ්‍යාපනික ප්‍රවේශයේ විෂමතා ආමන්ත්‍රණය කිරීම, නිපුණතා සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සහ ශ්‍රම බලකායේ කාන්තා පූර්ණ සහභාගීත්වයට ඇති බාධක වලට අභියෝග කිරීම තීරණාත්මක පියවරයන් වේ. අඛණ්ඩ පර්යේෂණ සහ ප්‍රතිපත්ති මුලපිරීම් ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ සහ රැකියා ක්ෂේත්‍රයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ ගතිකත්වයේ අනාගතය හැඩගැස්වීම සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ඇත. මෑත වසරවලදී, ශ්‍රී ලංකාව, කාන්තාවන් සඳහා අධ්‍යාපනය සහ දේශපාලන නියෝජනය වැනි ක්ෂේත්‍රවල කැපී පෙනෙන ප්‍රගතියක් අත්කර ගෙන ඇත. කෙසේ වෙතත්, ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය, ආර්ථික විෂමතා සහ නායකත්ව භූමිකාවන්හි අඩු නියෝජනය ඇතුළු සැලකිය යුතු අභියෝග දිගටම පවතී. ශ්‍රී ලංකාව තුළ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ප්‍රවර්ධනය කිරීමට සහ වඩාත් ගුණාත්මක සමාජයක් නිර්මාණය කිරීමට අඛණ්ඩ අන්තර් විනය පර්යේෂණ සහ විද්වතුන්, සිවිල් සමාජය සහ ප්‍රතිපත්ති සම්පාදකයින් අතර සහයෝගීතාවය, ප්‍රතිපත්ති මුලපිරීම් සහ ප්‍රජා මූලික උත්සාහයන් අත්‍යවශ්‍ය වේ. මානව විද්‍යාත්මක දෘෂ්ටිකෝණයකින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය අධ්‍යයනය කිරීමෙන්, පර්යේෂකයන් අරමුණු කරන්නේ ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ අත්‍යවශ්‍ය සංකල්පවලට අභියෝග කිරීම, ස්ත්‍රී පුරුෂ සමාජභාවය ගොඩනැගීම් කෙරෙහි සමාජ හා සංස්කෘතික බලපෑම් ඉස්මතු කිරීම සහ විවිධ සමාජ තුළ ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ වඩාත් සියුම් අවබෝධය සඳහා දායක වීමයි.

**මුඛ්‍ය පද:** දේශපාලන නියෝජනය, මානව විද්‍යාව, ස්ත්‍රීපුරුෂ සමාජභාවය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය, ස්ත්‍රීපුරුෂ සමානාත්මතාවය

## හැඳින්වීම

කිසියම් රටක අනන්‍යතා හා සම්ප්‍රදායන් තුළ හිඳිමින් පුද්ගලයන් විසින් විවිධ සමාජ ව්‍යුහයන් හා සම්බන්ධතා පවත්වාගෙන යනු ලබන අතර එකී සමාජ ව්‍යුහයන් හා සම්බන්ධතා අවබෝධ කරගැනීමෙහිලා ස්ත්‍රීපුරුෂ සමාජභාවය පිළිබඳව කියවීමක් අත්‍යවශ්‍ය වේ. සමාජ, සංස්කෘතික සහ ඓතිහාසික ගොඩනැගීම් සහ පුද්ගලයන්ගේ අත්දැකීම්, අනන්‍යතා සහ සමාජයේ භූමිකාවන් හැඩගස්වන්නේ කෙසේද යන්න ස්ත්‍රී පුරුෂ සමාජභාවය හරහා අවබෝධ කරගත හැකිය. ස්ත්‍රී පුරුෂභාවය සමාජ නිර්මිතයක් ලෙස සලකනු ලැබේ. එනම් එය ජීව විද්‍යාත්මකව නිර්ණය නොවන නමුත් සංස්කෘතික, ඓතිහාසික සහ සමාජීය බලපෑම් මත හැඩගැසී ඇත (Butler,1990). ස්ත්‍රීපුරුෂ සමාජභාවයේ

ගතිකත්වය යන්නෙන් අදහස් කරන්නේ පුද්ගලයන්ගේ ස්ත්‍රීපුරුෂ අනන්‍යතා අනුව හැඩගැසෙන සමාජ, සංස්කෘතික සහ අන්තර්-පුද්ගල සබඳතාවල පවතින අන්තර් ක්‍රියාකාරිත්වයයි. ඕනෑම සමාජයක් ස්ත්‍රී පුරුෂ සමාජභාවය සමඟ සම්බන්ධ වී ඇති නිශ්චිත භූමිකාවන්, හැසිරීම් සහ වගකීම් කුමක්ද යන්න නියම කරයි. නිදසුනක් වශයෙන්, රැකියාව, පවුල සහ සමාජ සම්බන්ධතා පිළිබඳව යම් යම් අපේක්ෂාවන් මෙලෙස නියම කරයි. ස්ත්‍රී හෝ පුරුෂ යන එක් පාර්ශවයක් අනෙක් පාර්ශවයට වඩා වැඩි බලපෑමක්, අධිකාරියක් හෝ තීරණ ගැනීමේ බලයක් දැරීම මඟින් ස්ත්‍රී පුරුෂභාවයේ ගතිකත්වයක් ඇතිවිය හැකිය. මෙම ගතිකත්වය සමීප සබඳතාවල සිට පුළුල් සමාජ ව්‍යුහයන් දක්වා ව්‍යාප්ත විය හැකිය. (Connell, 1987). සංස්කෘතික වටිනාකම්, සමාජ සම්මතයන් සහ නෛතික රාමුවල වෙනස්කම් වලට ප්‍රතිචාර දක්වමින් කාලයත් සමඟ ස්ත්‍රී පුරුෂභාවයේ ගතිකත්වය පරිණාමය වේ. මේ අනුව සංස්කෘතීන්, පරම්පරා සහ සමාජ කණ්ඩායම් අතර ස්ත්‍රී පුරුෂභාවය සැලකිය යුතු ලෙස වෙනස් විය හැකි අතර ස්ථාපිත සම්මතයන්ට අභියෝග කිරීමට හෝ ඒවා ශක්තිමත් කිරීමට ද ඉඩ ඇති බව පෙනේ. කිසිඳු ලෙසකින් වෙනස් කොට සැළකීමකට හෝ අගතියකට මුහුණ නොදී පුද්ගලයන්ට තම ලිංග අනන්‍යතාවය ප්‍රකාශ කිරීමට නිදහස ඇති සමානාත්මතා සමාජයක් ප්‍රවර්ධනය කිරීම සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ගතිකත්වය අවබෝධ කර ගැනීම ඉතා වැදගත් වේ. විවිධ ලෙස ස්ත්‍රී පුරුෂභාවය ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ පවතින සංකීර්ණතා සහ විචලනයන් පිළිගැනීම සහ අසමාන ලෙස සැළකීම ඉවත් කිරීමට කටයුතු කිරීම ද සමාජීය අපේක්ෂාවන් හෝ සම්මතයන් නොතකා, පුද්ගලයන් ස්වයං-හඳුනාගත් ලිංග අනන්‍යතාවලට ගරු කිරීම සහ තහවුරු කිරීම ද එයින් අදහස් වේ. (Fenstermaker & West, 2002).

ශ්‍රී ලංකාවේ දීර්ඝ ඉතිහාසය ගොඩනැගෙන්නේ එහි භූ දර්ශනය, විවිධ භාෂාවන් හා සාහිත්‍ය, අඛණ්ඩ සම්ප්‍රදායන් හා සංස්කෘතික විවිධත්වය පදනම් කරගනිමිනි. එලෙස ගොඩනැගෙන ශ්‍රී ලාංකික අනන්‍යතාවය, විවිධ ජන වර්ග හා පොහොසත් සංස්කෘතික උරුම මඟින් තවදුරටත් ආරක්ෂා වී තිබීම හරහා ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ ගතිකත්වය පිළිබඳව කියවීමක් සිදු කිරීමට අවශ්‍ය පසුබිම සකස් වී තිබේ. රට තුළ පවත්නා සමාජ අසමානතා ආමන්ත්‍රණය කිරීමටත් රටේ සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමටත් මෙම ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ ගතිකත්වය අවබෝධ කර ගැනීම වැදගත් වේ. මන්ද, රටක පැවැත්මේ හා සංවර්ධනයේ ප්‍රධාන මිනුම් දඬු තීරණය වනුයේ එම රටේ ජීවත්වන පුරවැසියන්ගේ හැසිරීම් හා ක්‍රියාකලාපය තුළිනි.

ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ බහුවිධ ගතිකත්වය හෙළිදරව් කිරීමේදී මානව විද්‍යාව ප්‍රධාන කාර්යයක් ඉටු කරනු ලබයි. එසේම ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවට, සමාජ සාධාරණත්වය හා අන්තර්ග්‍රහණය පිළිබඳ අඛණ්ඩ කතිකාවතක් ඇති කිරීමට ද දායක වේ. ඓතිහාසික, සංස්කෘතික හා සමකාලීන සාධක මඟින් ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ භූමිකාවන් අනන්‍යතා හා බල ගතිකත්වය ගොඩනැගී ඇති ආකාරය හෙළිදරව් කිරීමට මානව විද්‍යාඥයන් විසින් පෙළඹී ඇත. ඒ අනුව මානව විද්‍යාත්මක ප්‍රවේශයක් ඔස්සේ ශ්‍රී ලංකාවේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ගතිකත්වය බහුවිධ දෘෂ්ටිකෝණයකින් හැදෑරීම මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වේ.

**ශ්‍රී ලංකාවේ ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ ඓතිහාසික සන්දර්භය**

ශ්‍රී ලංකාවේ සමකාලීන ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳව අවබෝධ කර ගැනීම සඳහා ඓතිහාසික සන්දර්භය වෙත මානව විද්‍යාඥයින් විසින් පළමුව අවධානය යොමු කරනු ලබයි. මෙරට ඉතිහාසය සංක්‍රමණ හා යටත්විජිතවාද හා විවිධ පරාසයක දිවයන ආගමික හා සංස්කෘතික බලපෑම් වලින් පෝෂණය වී ඇති අතර ඒවා ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සම්මතයන් හා ආරක්ෂාවන් එකෙනෙකට වෙනස් ලෙස හැඩගන්වයි. ශ්‍රී ලංකාවේ ඉතිහාසය ගොඩනැගීමේදී බුද්ධාගමේ බලපෑම ඍජුවම ලැබී ඇති අතර ථේරවාද බෞද්ධ සම්ප්‍රදාය පුරුෂාධිපත්‍යය සම්මතයන් ස්ථාපිත කරනු ලබන අතරම ස්ත්‍රීන් වෙත ද ආගමිකායතන තනතුරු වෙත යොමු කිරීමට ද පෙළඹුණු බව මහාවංසය, දීපවංසය ආදී වූ ඓතිහාසික ලේඛන සාක්ෂි සාධක සපයයි. බුද්ධාගම සහ හින්දු ආගම වැනි ආගමික විශ්වාසයන්ගෙන් ස්ත්‍රී පුරුෂ භූමිකාවන්ට බලපෑම් ඇති වූ අතර බොහෝ විට රාජකාරිය, ගෞරවය සහ පවුල යන සංකල්ප සමඟ එය බැඳී ඇත. නිදසුනක් ලෙස බුද්ධ ධර්මයේ ඉගැන්වීම් වලට අනුව ස්ත්‍රීන් හා පුරුෂයන්ගේ භූමිකාවන් වෙන් වෙන් වශයෙන් දක්වා පවුල තුළ ස්වාමියාගෙන් බිරිඳට ද

බිරිඳගෙන් ස්වාමියාට විය යුතු යුතුකම් හා වගකීම් ආදිය සිගාලෝවාද සූත්‍රය ආදී ඉගැන්වීම් මඟින් දක්වා ස්ත්‍රී පුරුෂ සමාජභාවය තහවුරු කිරීමට උත්හාස ගෙන ඇත.

යටත්විජිතකරණයේ බලපෑම සැළකීමේදී ක්‍රි.ව 1505 සිට ක්‍රි.ව. 1948 දක්වා කාල සීමාව තුල පෘතුගීසි, ලන්දේසි හා ඉංග්‍රීසි පාලන සමයේ දී යුරෝපීය වටිනාකම් හා ආයතන පැනවීම ආදිය වෙත ස්ත්‍රී පුරුෂභාවය, පවුල් ව්‍යුහයන් හා බල ගතිකත්වය පිළිබඳ සංකල්ප බලපාන ලදී. ක්‍රි.ව. 1815 සිට ක්‍රි.ව 1948 දක්වා ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය යටත්විජිත පාලනය දිවයිනේ සංස්කෘතික හ සමාජීය දේහයට සැළකිය යුතු ලෙස බලපෑවේය. රෝම ලන්දේසි නීතිය හරහා විවාහ ක්‍රමය නීතිගත කොට ස්ථාපිත කිරීම, උප්පැන්න/ මරණ ලියාපදිංචි කිරීම නෛතික පසුබිමක සිට සකස් කොට ස්ත්‍රීපුරුෂ සමාජභාවයට නීතිමය රැකුලක් ලබාදීම ඉතා වැදගත් සංදිස්ථානයකි. (Obeyesekere & Gombrich,1989) බ්‍රිතාන්‍ය යටත් විජිතවාදය ශ්‍රී ලංකාවේ බුදු දහම සමඟ ඡේදනය වූ ආකාරය පිළිබඳවත් බෞද්ධ ආයතන හා පැවිදි ප්‍රජාවන් සමඟ බ්‍රිතාන්‍ය පරිපාලනය සම්බන්ධ වීම තුලින් බෞද්ධ සමාජය තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ප්‍රතිවිපාක සමඟ ආගමික හුදර්ශනයේ වෙනස්කම් වලට තුඩු දුන් ආකාරය පැහැදිලි කරයි. (Jayawardena,1995) සිය The White Woman's Other Burden: Western Women and South Asia during British Rule කෘතිය හරහා බ්‍රිතාන්‍ය යටත් විජිත පාලන සමයේදී උඩරට රාජධානිය තුල ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අවබෝධයක් ලබා දෙයි. ස්ත්‍රී පුරුෂ සමාජභාවයට බලපාන බ්‍රිතාන්‍ය යටත්විජිත ප්‍රතිපත්ති, උඩරට සම්ප්‍රදායික විවාහ ක්‍රමයට හා දේපළ අයිතිවාසිකම් වලට බලපෑ ආකාරය වඩාත් විස්තරාත්මක ලෙස දක්වයි. බ්‍රිතාන්‍ය යටහ්විජිතවාදයේ බලපෑම, සමාජ වෙනස්වීම හා ප්‍රතිරෝධ ව්‍යාපාර වලට ද බලපාන ලදී. යටත්විජිත සමයේ ස්වාධීනත්වය හා ස්වයං නීර්ණය සඳහා වූ අරගල ස්ත්‍රීපුරුෂ සමාජභාවය කෙරෙහි බලපෑම් ඇති කරන ලදී.

**ශ්‍රී ලංකාවේ ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ ගතිකත්වය**

ශ්‍රී ලංකාවේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳව මානව විද්‍යාත්මක අධ්‍යයනයන් සෑම විටම ස්වදේශික භාවිතයන්, යටත්විජිත උරුමවල ශේෂයන් මෙන්ම සමකාලීන සමාජ වෙනස්වීම් වල එකතුවක් ඔස්සේ කාලය හා සම්ප්‍රදාය අනුව යමින් සිදු කළ යුතු කියවීමකි. විවිධ ජනවර්ග, ආගම් හා සමාජ පංති වල දායකත්වය මෙම කියවීම් වලට ඍජුවම බලපායි. විශේෂයෙන්ම බුද්ධාගම, හින්දු ආගම, ඉස්ලාම් ආගම හා ක්‍රිස්තියානි අගම් හා ධර්මවල ඉදිරිපත් වන ස්ත්‍රී පුරුෂ සමාජභාවවල භූමිකාවන්, සබඳතා සහ අනන්‍යතා ගොඩනගන්නේ කෙසේද යන්න පිළිබඳව පැහැදිලි දෘෂ්ඨිකෝණ ලබාදෙන සංස්කෘතික විවිධත්වය නිතැතින්ම මානව විද්‍යාඥයාගේ අවධානයට යොමු වේ. මානව විද්‍යාඥයින් විසින් සංස්කෘතීන් සහ සමාජයන් පුරුෂත්වය සහ ස්ත්‍රීත්වය පිළිබඳ සංකල්ප සකස් කරන ආකාරය මෙන්ම මෙම සංකල්ප ජාතිය, පංතිය, ආගම සහ ලිංගිකත්වය වැනි අනෙකුත් සමාජ මානයන් සමඟ ඡේදනය වන ආකාරය අධ්‍යයනය කරයි. ඒ අනුව ස්ත්‍රී පුරුෂ සමාජභාවය යනු හුදකලා ප්‍රපංචයක් නොව සංස්කෘතියේ හා සමාජයේ ව්‍යුහයට සංකීර්ණ ලෙස සම්බන්ධ වූවක් බව පැහැදිලි වේ. ස්ත්‍රී පුරුෂභාවය ස්ථාවර හෝ විශ්වීය සංකල්පයක් ලෙස නොසලකන අතර, ඒ වෙනුවට කාලය හා ස්ථානය අනුව වෙනස් වන සමාජ හා සංස්කෘතික නිර්මිතයක් ලෙස සැලකේ. මානව විද්‍යාඥයින් විශේෂිත සංස්කෘතික සන්දර්භයන් තුළ ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ ගතිකත්වය අවබෝධ කර ගැනීමේ වැදගත්කම අවධාරනය කරයි, විවිධ සමාජවලට ස්ත්‍රී පුරුෂ භාවය සංවිධානය කිරීමට සහ අවබෝධ කර ගැනීමට විවිධ ක්‍රම ඇති බව හඳුනා ගනී. ගෝලීයකරණය, නාගරීකරණය හා සමාජ වෙනස්කම් හේතුවෙන් ශ්‍රී ලංකාවේ ස්ත්‍රීපුරුෂ සමාජභාවයේ සැළකිය යුතු වෙනස්කම් සිදුවෙමින් පවතී. සාම්ප්‍රදායික ස්ත්‍රීපුරුෂ සමාජභාවයට අභියෝග කරමින් ශ්‍රම බලකාය, අධ්‍යාපනය හා දේශපාලනය සඳහා කාන්තා සහභාගීත්වය වැඩි වී ඇත. ඇතැම් ක්ෂේත්‍ර වල ප්‍රගතියක් ලබා ඇති අතර සැළකිය යුතු අභියෝග දිගින් දිගටම පවතින බව පෙනේ.

**සංස්කෘතික විවිධත්වය**

සිංහල, දෙමළ, මුස්ලිම් හා විවිධ ස්වදේශික ප්‍රජාවන් තමන්ටම ආවේණික සංස්කෘතික සම්මතයන් හා භාවිතයන් තුළ හිඳිමින් ජීවත්වන අතර ඒ සෑම එකකටම ස්ත්‍රීපුරුෂ සමාජභාවය පිළිබඳ භූමිකාවන් සහ සබඳතා පිළිබඳ එකෙනෙකට වෙනස් දෘෂ්ටිකෝණ ඇත. නිදසුනක් වශයෙන්, දෙමළ සංස්කෘතිය තුළ, සම්භාව්‍ය නර්තන ආකෘතියක් වන භරත නාට්‍යය සම්ප්‍රදායිකව කාන්තාවන් විසින් ප්‍රගුණ කරයි. මෙම නර්තන ආකෘතිය දෙමළ සංස්කෘතික අනන්‍යතාවය තුළ ගැඹුරින් කාවැදී ඇති අතර ස්ත්‍රී පුරුෂ සමාජභාවීය භූමිකාවන් සහ කලාත්මක

ප්‍රකාශනය හැඩගැස්වීමේ කාර්යභාරයක් ඉටු කර ඇත. වර්තමානය වන විට මෙම නර්තන සම්ප්‍රදාය පුරුෂ පක්ෂය විසින් ද ප්‍රගුණ කළ ද තවමත් එය කාන්තාවන්ට ආවේණික වූ නර්තන සම්ප්‍රදායක් ලෙස මූලිකත්වය ගනු ලබයි.

ශ්‍රී ලංකාවේ විවිධ සංස්කෘතික උත්සව සහ චාරිත්‍ර වාරිත්‍ර තුළ බොහෝ විට නිශ්චිත ස්ත්‍රී පුරුෂ භූමිකාවන් ඇතුළත් වේ. නිදසුනක් වශයෙන්, සිංහල අලුත් අවුරුද්ද හා අවුරුදු චාරිත්‍ර ශ්‍රී ලාංකික පවුල බද්ධ කරගත් ස්ත්‍රී පුරුෂභාවයේ එක් එක් භූමිකාවන් මනාවට ඉස්මතු කරවන සංස්කෘතිකාංගයකි. ගෘහයේ සමෘද්ධිය සහතික කිරීම සඳහා කාන්තාවන්ගේ කාර්යභාරය සංකේතවත් කරමින්, ලිප ගිණි මෙලවීම, ආහාර පිසීම ආදී වූ චාරිත්‍ර මව මූලික කරගෙන සිදු කරනු ලබයි. එසේම වැඩ ඇල්ලීම, ගණුදෙණු කිරීම හා ආහාර අනුභවය ආදී වූ ප්‍රධාන චාරිත්‍ර සිදු වන්නේ පියා මූලික කර ගත් පවුල තුලින් වේ. එසේම, මහනුවර වාර්ෂික ඇසළ පෙරහැර මංගල්‍යයේදී, සම්ප්‍රදායිකව පිරිමින් බෙර වාදකයින් සහ නර්තන ශිල්පීන් ලෙස රඟ දක්වන අතර කාන්තාවන්ට සහායක භූමිකාවන් ඉටු කළ හැකිය. මේවා තවදුරටත් සම්ප්‍රදායන් ලෙසින් ඉදිරියට ගමන් කරමින් පවතී. කෙසේවෙතත් ඇසළ පෙරහැරට කාන්තාවන්ට සම්බන්ධ වීමට හැකි නොවීම පිළිබඳව ප්‍රශ්න හ විවේචන ද වර්තමානය වන විට ඉදිරිපත් වී ඇත. ඉතිහාසයට අනුව දන්ත ධාතූන් වහන්සේ සුරක්ෂිතව ලංකාවට වැඩම කරවන ලද්දේ හේමමාලා කුමරිය නම්, කාන්තාවකට එම දන්ත ධාතුව වැඩවමා සිදු කරනු ලබන පෙරහැරට සම්බන්ධ වීමට ඇති තහනම පිළිබඳව වර්තමාන තරුණ තරුණියන් ප්‍රශ්න කිරීම තුලින් මෙම සම්ප්‍රදායන්ට එරෙහිව ස්ත්‍රී පුරුෂභාවයේ ගතිකත්වයක් ඇති කිරීමට කිසියම් හැකියවක් ඇති බව පෙනේ.

ශ්‍රී ලංකාව තුළ ථේරවාදී බුදුදහමේ දීර්ඝ කාලීන සම්ප්‍රදායක් ඇත. සංඝයා ප්‍රධාන වශයෙන් පිරිමි වන අතර, පැවිදි බව ලබා ගත් භික්ෂුණීන් ප්‍රමාණයෙන් තරමක් කුඩා නමුත් කැප වූ ප්‍රජාවක් ඇත. මෙය බෞද්ධ පිළිවෙත තුළ සාම්ප්‍රදායික ස්ත්‍රී පුරුෂ භූමිකාවන්ට අභියෝග කරයි. ශ්‍රී ලංකාවේ ක්‍රිස්තියානි ප්‍රජාව තුළ ද ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයටම පැවිදි වීමේ අවස්ථාව ලබා දී ඇති අතර එහි කාන්තා නියෝජනයේ ක්‍රමික ඉහළ යාමක් ද දක්නට ලැබේ. කෙසේ වෙතත්, මුස්ලිම් ප්‍රජාව තුළ කාන්තාවන් ආගමික කටයුතු වලින් ඉවත් කර ඇති අතර ඔවුන්ට පල්ලි යාම පවා තහනම් කර ඇත.

**විවාහ ක්‍රමය හා සමාජ සංවිධාන**

ශ්‍රී ලාංකික ජන සමාජයේ පවුල් ව්‍යුහයන් හා සමාජ අපේක්ෂාවන් වල ඉදිරිදර්ශන විවාහ ක්‍රමය හා සමාජ සංවිධාන වල ක්‍රියාත්මක වීම අනුව වෙනස් වේ. උදාහරණ ලෙස සිංහල හා මුස්ලිම් සමාජ වල පීතෘ මූලික පවුල් ක්‍රමයක් ක්‍රියාත්මක වන අතර විවිධ පාරම්පරික දෙමළ ජන කොටස් අතර මාතෘමූලික පවුල් ක්‍රමයක් ක්‍රියාත්මක වේ. මෙරට සංස්කෘතියේ බහුලව පවතින පීතෘ මූලික පවුල් ක්‍රමයේදී සෑම විටම පියා මූලික කරගත් පවුල් ක්‍රමයක් ක්‍රියාත්මක වේ. විවාහ බන්ධන හා ඥාතීත්ව සබඳතා වලදී පිය පාර්ශවය මුල් වන අතර සෑම විටම විවාහයෙන් පසු බිරිඳ සිය ස්වාමියාගේ ඥාති පර්ශවය වෙත ගොස් ජීවත් වන අතර දේපළ පැවරීම් ආදිය සිදුවන්නේ ද පියාගෙන් පුතාට ආදී ලෙසිනි. නමුත් මාතෘ මූලික දෙමළ සමාජ වල විවාහයෙන් පසු ස්වාමියා කාන්තාවගේ නිවසේ පදිංචි වන අතර දේපළ බෙදී යන්නේ මවගෙන් දියණියට යි. නැතහොත් මවගේ සහෝදරයාට ඒවා හිමි වේ.

ශ්‍රී ලංකාවේ මුස්ලිම් ප්‍රජාව විවාහය සහ දික්කසාදය සම්බන්ධයෙන් වෙනම නීති පද්ධතියක් අනුගමනය කරයි. ඉස්ලාමීය නීතිය මත පදනම් වූ ක්වාසි (Quazi) අධිකරණ පද්ධතිය ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන්ගේ පවුල් කටයුතු පාලනය කරයි. මෙම නීතිමය රාමුව විවාහය, දික්කසාදය සහ උරුමය සම්බන්ධ ගැටළු ඇතුළුව, මුස්ලිම් ප්‍රජාව තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවයට බලපෑම් කරයි.

ශ්‍රී ලංකාවේ විවාහ ක්‍රමය තුළ ''බින්න" නමින් හැඳින්වෙන විවාහ ක්‍රමයක් ඇත. මෙහිදී ස්වාමියා විවාහයෙන් පසුව තම බිරිඳගේ නිවසේ ඥාතීන් සමඟ ජීවත් වීමට යයි. මෙහිදී කාන්තාවන්ට විවාහයෙන් පසුව පවා යම් යම් දේපළ හිමිකම් ඇති අතර, ඔවුන්ට යම් ආර්ථික ස්වාධීනත්වයකට ඉඩ සලසයි. මෙම සම්ප්‍රදාය ශ්‍රී ලංකාව තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ විවිධත්වය ඉස්මතු කරයි. තවමත් ශ්‍රී ලංකාවේ උඩරට සාම්ප්‍රදායික ප්‍රදේශ වල උඩරට නීතිය යටතේ මෙම ක්‍රමය ක්‍රියාත්මක වේ (De Soysa, 1998) .

**දේශීය සම්ප්‍රදායයන්**

ශ්‍රී ලංකාවේ ආදිවාසීන් වන වැද්දා ප්‍රජාව ස්ත්‍රීපුරුෂ සමාජභාවයේ ගතිකත්වයේ ඓතිහාසික අංග පරීක්ෂා කිරීමට තොරතුරු සපයයි. ඔවුන්ගේ

ලිංගභේද භූමිකාවට හා සමාජ ව්‍යුහයට බලපා ඇති වෙනස් සංස්කෘතික සම්ප්‍රදායන් හා භාවිතයන් පවත්වාගෙන ගොස් ඇත. ඔවුන්ගේ දඩයම් හා ආහාර එකතු කරන ජීවන රටාවේ බලපෑමට අනුව වෙනස් ස්ත්‍රී පුරුෂ භූමිකාවන් ඇත. කාන්තාවන් ආහාර එකතු කිරීමේදී තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරන අතර පිරිමින් දඩයම් කිරීම සඳහා මූලික වශයෙන් වගකිව යුතුය. මෙම ශ්‍රම විභජනය වැද්දන්ගේ අනන්‍ය සංස්කෘතික හා ආර්ථික භාවිතයන් පිළිබිඹු කරයි. ආදිවාසී ප්‍රජාව අධ්‍යයනය කරන මානව විද්‍යාත්මක අධ්‍යයන හා මානවවංශ විද්‍යාත්මක අධ්‍යයන මෙම කණ්ඩායම් ඔවුන්ගේ සමාජ තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය සංවිධානය කර ඇති ආකාරය දක්වයි. තවමත් සාම්ප්‍රදායික වැද්දා ජන සමාජය තුළ කාන්තාව ඉදිරියට පැමිණ සමාජගත වීමේ ප්‍රතිශතය ඉතා පහළ මට්ටමක පවතින අතර තවමත් ගෘහාශ්‍රිතව රැදෙමින් පවුලේ හා දරුවන්ගේ අධ්‍යාපනය ආදී කටයුතු පිළිබඳව වගකීම් නොපිරිහෙලා ඉටු කිරීමට මූලිකත්වය ගෙන කටයුතු කරනු ලබන බව පෙනේ. (De Silva & Punchihewa, 2011). කෙසේවෙතත්, විවිධ සංවර්ධන ව්‍යාපෘති ආදිය හමුවේ මෙම ප්‍රජාවට තම භූමි අහිමි වී ගොස් වෙනත් ප්‍රදේශ වලට සංක්‍රමණය කර නැවත ජනාවාස පිහිටු වීමට සිදු විය. එහි අතුරු ප්‍රතිඵලයක් ලෙස ඔවුන්ගේ සාම්ප්‍රදායික දඩයම් ක්‍රම හා වගා ක්‍රම කිරීමට ඉඩම් අහිමි වී ගිය අතර ඔවුන්ට සාමාන්‍ය ජන ජීවිතයට හුරුවීමට සිදු විය. කාන්තාවට ද තම ගෘහස්ත ජීවිතයෙන් මිදී රැකියාවන් කිරීමට සිදු වීය. එමඟින් ඔවුන්ගේ සමාජානුයෝජනය ඉහළ ගිය බව පැහැදිලි වේ.


ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික අත්කම් සහ වෘත්තීන් සැළකූ විට ශ්‍රී ලංකාවේ පොහොසත් ශිල්ප සම්ප්‍රදායන් සඳහා බොහෝ විට වෙනස් ස්ත්‍රී පුරුෂ ගතිකයන් ඇත. නිදසුනක් වශයෙන්, සමහර ග්‍රාමීය ප්‍රජාවන්හි සිදු කරනු ලබන මැටි භාණ්ඩ සෑදීම, වේවැල් කර්මාන්තය, බීරළු ගෙතීම වැනි මැහුම් ගෙතුම් කලාවන් පිරිමි සහ ගැහැණු යන දෙඅංශයෙන්ම සම්බන්ධ විය හැකි නමුත් නිෂ්පාදන ක්‍රියාවලියේ විවිධ භූමිකාවන් ඇත. එකී භූමිකාවන් තුල ප්‍රධාන ක්‍රියාවළියක් කාන්තාව අතින් සිදු වේ.

ශ්‍රී ලංකාවේ ජනප්‍රවාද සහ වාචික සම්ප්‍රදායන් බොහෝ විට සංස්කෘතික ලිංග සම්මතයන් පිළිබිඹු කරන සහ ශක්තිමත් කරන කතා වලින් අඩංගු වේ. මෙම කතාන්දර ස්ත්‍රී පුරුෂ සමාජභාවයට අදාළ භූමිකාවන්, අපේක්ෂාවන් සහ සදාචාරාත්මක පාඩම් නිරූපණය කරයි. සෑම විටම මෙම ජනප්‍රවාද හා සමාජ සම්මතයන් එක් පරම්පරාවකින් තවත් පරම්පරාවකට ගෙන යාමේ මූලිකත්වය නිතැතින්ම ලබා දී ඇත්තේ මව මූලික කරගත් කාන්තා පාර්ශවයටයි. මව හෝ පවුලේ ආච්චි මෙහි මූලිකත්වය ගනු ලබයි. වර්තමානය තෙක්ම එය එලෙසම පැවතෙන අතරම ලිංග භේදයක් නොමැතිවම ජනප්‍රවාද පාරම්පරිකව ගෙන යාම සිදු වේ.

## අධ්‍යාපනය හා රැකියාව

අධ්‍යාපනය සඳහා ප්‍රවේශය ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයටම පුළුල් වී ඇති අතර වෘත්තීය අවස්ථා පුළුල් වීම ද මෙයට සමානුපාතිකව වැඩි වී ඇත. මෙරට විශ්ව විද්‍යාල ප්‍රවේශයේ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් ලබා දී ඇති සංඛ්‍යාත්මක දත්ත සළකා බැලීමේදී එහි බහුතරය නියෝජනය කරන්නේ කාන්තාවන් බව පෙනේ (රූප සටහන අංක 1).

රූප සටහන 1: විශ්වවිද්‍යාල ප්‍රවේශය සංඛ්‍යා දත්ත 2021





*මූලාශ්‍රය: විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව*

වර්ෂ 1833 සිට සුදුසුකම් මත රාජ්‍ය සේවයට ඇතුළත් වීමට මෙරට තුළ අවස්ථාව හිමිවීමේ අග්‍ර ඵලයක් ලෙස කාන්තාවන්ට රාජ්‍ය පරිපාලන සේවයේ ඉහළ තනතුරු දැරීමට හැකි වීම සඳහන් කළ හැකිය. ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ප්‍රදේශ වල ගුණාත්මක අධ්‍යාපනය සඳහා ඇති ප්‍රවේශය සම්බන්ධව තවදුරටත් විෂමතා, එනම් ගුණාත්මක අධ්‍යාපනය වෙත යොමු වීමේ අභියෝග පවතී. දිළිඳුභාවය, ස්ත්‍රී පුරුෂ සමාජභවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය හා හිරිහැර පිළිබඳ කණස්සල්ල

තවදුරටත් කාන්තාවන්ගේ ග්‍රාමීය අධ්‍යාපනය වෙත පිවිසීමේ මංපෙත් අවහිර කර ඇති බව පෙනේ.

රූප සටහන 2: ශ්‍රී ලංකාවේ කාන්තා ශ්‍රම බලකායේ සහභාගීත්ව අනුපාත (2006 -2017)




*මූලාශ්‍රය: USAID, 2019*

කාන්තා අධ්‍යාපනයේ ඉහළ මට්ටම්, අඩු සාඵල්‍යතා අනුපාත මෙන්ම වාර්ෂිකව 6% ක් පමණ වන ආර්ථික වර්ධනයක් සහිත ඉහළ මධ්‍යම ආදායම් ලබන රටක් ලෙස මානව සංවර්ධන ප්‍රතිඵලවල දිගුකාලීන ජයග්‍රහණ අත්වින්ද ද තවමත් ශ්‍රම බලකා සහභාගීත්වයේ (Labour Force Participation -LPF) ලොව 20 වැනි විශාලතම ස්ත්‍රී පුරුෂ පරතරය ඇත්තේ ශ්‍රී ලංකාවට යි (Solotaroff et. al, 2020). ගෘහස්ත භූමිකාවන් සහ වගකීම් කාන්තාවන් මත අසමාන ලෙස පැටවීම, මානව ප්‍රාග්ධන නොගැලපීම මගින් කාන්තාවන් රැකියා වෙළඳපොලවල් විසින් ඉල්ලා සිටින කුසලතා නිසියාකාරව සකසා ගැනීමට නොහැකි වීම, රැකියා සෙවීම, බඳවා ගැනීම් සහ උසස්වීම් ක්‍රියාවලීන්හි ස්ත්‍රී පුරුෂභාවය අනුව වෙනස්කම් වලට භාජනය කිරීම ආදිය ශ්‍රම වෙළඳපොළ තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ පරතරය පැහැදිලි කරන ප්‍රධාන සාධක ලෙස හඳුනා ගත හැකිය (Solotaroff et. al, 2020). මිනිසාගේ ජීවන අවධි වලදී පිරිමින් සහ කාන්තාවන් තීරණ ගන්නා විට, අධ්‍යාපනය, වෘත්තිය සහ පවුල් සංස්ථාව ගොඩනැගීම යනාදී සාධක කෙරෙහි අවධානය යොමු කරන අතරම එය උපතේ සිට පවුල, පාසල, සමාජය සහ සේවා ස්ථාන දක්වා විහිදේ. එය අවසානයේ දී ශ්‍රම බලකායේ සහභාගීත්වය සහ අනෙකුත් ශ්‍රම වෙළඳපල ප්‍රතිඵල කෙරෙහි බලපෑමක් ඇති කරයි (රූප සටහන අංක 3).

රූප සටහන 3: ශ්‍රී ලංකාවේ ශ්‍රම වෙළඳපොලේ කාන්තා සහභාගීත්වය සක්‍රීය කරන/සීමා කරන සාධක

| Group | Enabling condition | Constraint |
|---|---|---|
| Married women | Age | Remittances from abroad |
| | Educational attainment from GCE Advanced Level and beyond | Islamic Moor ethno-religious identity and disability; |
| | Higher per capita household consumption | Education up to Ordinary Level |
| | Availability of domestic help | Employment and education characteristics of male household members and male head of household |
| | A higher share of employed females, relative to males with the same educational attainment as the individual in the district | More people employed in manufacturing and services, relative to agriculture in the district |
| | Living on estates | Residence in Central, Eastern and North Western Province |
| | Having children later rather than earlier | |
| Single women | Age | Relatively higher status of household consumption |
| | All levels of education above primary level | Greater rate of unemployment |
| | The presence of other adult women in the household | |
| | A higher share of employed females in the district, relative to males in the same education category as the individual | |
| | Living on estates | |
| Female Heads of Households | Age | Remittances from abroad |
| | A university education | Earnings of male members of household |
| | A large informal sector in the district | They have children below 5 years of age |
| | Living on estates | More people employed in manufacturing and services, relative to agriculture in the district |
| | | Whether they are residing in all provinces outside the Western Province. |

*මූලාශ්‍රය: ජාත්‍යන්තර කම්කරු සංවිධානය, 2016)*

ශ්‍රී ලංකාවේ සංස්කෘතික විවිධත්වය සැළකූ විට මුස්ලිම් හා ද්‍රවිඩ ජනතාව ස්ත්‍රීන්ව උසස් අධ්‍යාපනය වෙත යොමු කිරීමට යම් මැලිකමක් දැක්වන ලදී. 30 වසරක යුධ සමයේ ඇති වූ තත්ත්වයන් ද මෙයට බලපාන ලදී. කෙසේවෙතත් ද්‍රවිඩ හා මුස්ලිම් ප්‍රජාවගේ උසස් අධ්‍යාපනය වෙත යොමු වී ඇති කාන්තා නියෝජනය වර්තමානය වනට විට ඉහළ ගොස් ඇති බව පෙනේ. ශ්‍රී ලංකාවේ කාන්තාව සවිබල ගැන්වීම සඳහා අධ්‍යාපනය උත්ප්‍රේරකයක් වී ඇත. එමගින් කාන්තාවන්ට පුළුල් පරාසයක අවස්ථා වෙත ප්‍රවේශ වීමට, සාම්ප්‍රදායික ස්ත්‍රී පුරුෂ සමාජභාව භූමික්කවන්ට අභියෝග කිරීමට හා සමාජ, ආර්ථික හා දේශපාලන ක්ෂේත්‍රයන් හි වඩාත් ක්‍රියාකාරීව සහභාගී වීමට හැකියාව ලැබී ඇත. එසේම වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කිරීම හරහා ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයටම රටෙහි ශ්‍රම බලකාය වෙත ප්‍රවේශ වීමට අවශ්‍ය පහසුම් ලැබී ඇත. එමගින් අධ්‍යාපන, සෞඛ්‍යය හා නිෂ්පාදන වැනි අංශවල කාන්තා ශ්‍රම බලකාය ද ඉහළ ගොස් ඇත. කෙසේවෙතත්, විවිධ පරාසයන් තුළ නායකත්ව තනතුරු වල කාන්තා නියෝජනය වෙනත් රටවල කාන්තාවන්ගේ තත්වයට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ කාන්තාවන් සිටින්නේ බොහෝ පහළිනි. රාජ්‍ය හා පෞද්ගලික යන දෙඅංශයේම නායකත්වයේ හා තීරණ ගැනීමේ තනතුරුවල කාන්තාවන්ගේ නියෝජනය තිබුණ ද

තවමත් එහි බහුතර බලය පුරුෂාධිපත්‍යයට නතු වී ඇත. උදාහරණ ලෙස ත්‍රිවිධ හමුදා, පොලීසිය, රජයේ සංස්ථා හා දෙපාර්තුමේන්තු, විශ්ව විද්‍යාල හා අනෙකුත් උසස් අධ්‍යාපන ආයතන ආදියෙහි මුල්පුටු තවමත් පිරිමි පාර්ශවය විසින් හිමිකරගෙන ඇත. ශ්‍රී ලංකාවේ රැකියා වලින් කාන්තාවන් නියැලෙන රැකියාවලින් සැළකිය යුතු ප්‍රතිශතයක් අවිධිමත් සෙක්ටරයේ රැකියා වේ. මෙය අවම රැකියා සුරක්ෂිතභාවය, අවම ප්‍රතිලාභ හා සමාජ ආරක්ෂණය සඳහා ඇති සීමිත ප්‍රවේශයකි. මෙරට රැකියගත කාන්තාවන්ගෙන් බහුතරයක්ම විදේශගත ගෘහ සේවයේ නියුක්ත වන අතර මෙරටට වැඩිම විදේශ විනිමය තවමත් ලබාදෙන්නේ විදේශ ගත කාන්තාවන් විසිනි. දශක ගණනාවක් තිස්සේ ක්‍රියාත්මක වන පාලන ක්‍රමය, සංවර්ධන උපාය මාර්ග, අන්තර් වාර්ගික ගැටුම් සහ සමාජ-සංස්කෘතික සම්මතයන් සහ භාවිතයන් සියල්ල ශ්‍රී ලංකාවේ කාන්තා ප්‍රගතියේ තත්ත්වයට සම්බන්ධ සාධක වේ.

**දේශපාලන නියෝජනය**

ප්‍රජාතන්ත්‍රවාදය යනු රටක සියලු පුරවැසියන්ගේ නියෝජනය යි. එබැවින් රටක දේශපාලනයේ කාන්තා නියෝජනය පාලනය සඳහා අත්‍යවශ්‍ය වේ. ආණ්ඩු තුළ කාන්තා නියෝජනය පිළිබඳ ගෝලීය සංඛ්‍යාලේඛන අඛණ්ඩව වැඩිදියුණු වුවද සමාන දේශපාලන සහභාගීත්වය ලබාදීම තවමත් අභියෝගයකි. පසුගිය කාලය පුරාවටම කාන්තා මැතිවරණ නියෝජනයේ සැලකිය යුතු හිඩැස් ආමන්ත්‍රණය කිරීමට සහ වැඩි ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවයක් ලබා ගැනීමට ශ්‍රී ලංකාව ධනාත්මක පියවර කිහිපයක් ගෙන ඇත. පළාත් පාලන මට්ටමින් කෝටාවක් හඳුන්වාදීමත්, පළාත් මට්ටමින් කෝටාවක් සහිත නව මැතිවරණ ක්‍රමයක් හඳුන්වාදීමත් එවැනි එක් පියවරකි. කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ කාන්තාවන් දේශපාලන නියෝජනය සඳහා යොමුවීමේදී බරපතල බාධකවලට මුහුණ දෙමින් සිටින අතර, ජාතික ව්‍යවස්ථාදායකවල කාන්තා ප්‍රතිශතය අනුව ලෝකයේ පහළම රටවල් අතරට ශ්‍රී ලංකාව පැමිණ තිබේ (Wanigasinghe, 2022). නිදසුනක් වශයෙන්, 2015 හා 2020 පාර්ලිමේන්තු මැතිවරණයේ දී පාර්ලිමේන්තුවට තේරී පත් වූ කාන්තා නියෝජනය 5.3% කි (රූප සටහන අංක 4).

රූප සටහන 4: පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සංයුතිය (1947- 2020)

| Legislature | Year | Both Sexes | | Male | | Female | |
|---|---|---|---|---|---|---|---|
| | | No | % | No | % | No | % |
| House of Representatives (1st Parliament) | 1947 | 101 | 100.0 | 98 | 97.0 | 3 | 3.0 |
| House of Representatives (2nd Parliament) | 1952 | 101 | 100.0 | 99 | 98.0 | 2 | 2.0 |
| House of Representatives (3rd Parliament) | 1956 | 101 | 100.0 | 97 | 96.0 | 4 | 4.0 |
| House of Representatives (4th Parliament) | 1960 (March) | 157 | 100.0 | 154 | 98.1 | 3 | 1.9 |
| House of Representatives (5th Parliament) | 1960 (July) | 157 | 100.0 | 154 | 98.1 | 3 | 1.9 |
| House of Representatives (6th Parliament) | 1965 | 157 | 100.0 | 151 | 96.2 | 6 | 3.8 |
| House of Representatives (7th Parliament) | 1970 | 157 | 100.0 | 151 | 96.2 | 6 | 3.8 |
| 2nd National State Assembly (8th Parliament) | 1977 | 168 | 100.0 | 157 | 93.5 | 11 | 6.5 |
| 2nd Parliament of the D.S.R. of Sri Lanka (9th Parliament) | 1989 | 225 | 100.0 | 212 | 94.2 | 13 | 5.8 |
| 3rd Parliament of the D.S.R. of Sri Lanka (10th Parliament) | 1994 | 225 | 100.0 | 213 | 94.7 | 12 | 5.3 |
| 4th Parliament of the D.S.R. of Sri Lanka (11th Parliament) | 2000 | 225 | 100.0 | 216 | 96.0 | 9 | 4.0 |
| 5th Parliament of the D.S.R. of Sri Lanka (12th Parliament) | 2001 | 225 | 100.0 | 215 | 95.6 | 10 | 4.4 |
| 6th Parliament of the D.S.R. of Sri Lanka (13th Parliament) | 2004 | 225 | 100.0 | 212 | 94.2 | 13 | 5.8 |
| 7th Parliament of the D.S.R. of Sri Lanka (14th Parliament) | 2010 | 225 | 100.0 | 212 | 94.2 | 13 | 5.8 |
| 8th Parliament of the D.S.R. of Sri Lanka (15th Parliament) | 2015 | 225 | 100.0 | 213 | 94.7 | 12 | 5.3 |
| 9th Parliament of the D.S.R. of Sri Lanka (16th Parliament) | 2020 | 225 | 100.0 | 213 | 94.7 | 12 | 5.3 |

*මූලාශ්‍රය: ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, 2023*

1970 ට පෙර මැතිවරණවල සංඛ්‍යාත්මක දත්ත හා සසඳා බැලීමේදී 1977 සිට ශ්‍රී ලංකාවේ කාන්තා දේශපාලන සහභාගීත්වය අතින් ප්‍රගතියක් ලබා ඇති අතර කාන්තාවන් රජයේ හා ප්‍රාදේශීය නායකත්වයේ ඉහළ තනතුරු දරනු ලබයි. සිරිමාවෝ බණ්ඩාරණායක, චන්ද්‍රිකා කුමාරතුංග ප්‍රමුඛ වූ කාන්තා දේශපාලන නායිකාවන් විසින් කාන්තාවන් හට ද ඉහළ දේශපාලන බලතල හිමිකර ගත හැකි බව පෙන්නුම් කර ඇත (Jayaweera, 2000). කෙසේවෙතත්, රටේ දේශපාලන ක්ෂේත්‍රය පුරුෂ මූලිකත්වය තවදුරටත් පවතියි.

ශ්‍රී ලංකාවේ කාන්තා දේශපාලනයේ මැතිවරණ කෝටා හා අපීර ක්‍රියාකාරී ප්‍රතිපත්ති තුලින් දේශපාලන නිලතල වල සිටින කාන්තාවන් සංඛ්‍යාව ඉහළ නැංවීමට දායකත්වය ලබා දෙයි (Gunawardena, 2015). ශ්‍රී ලංකාවේ කාන්තාවන් විධිමත් දේශපාලන ව්‍යුහයන් තුල හා සිවිල් සමාජ සංවිධාන හරහා විවිධ දේශපාලන ක්‍රියාකාරකම් හා උපදේශන කටයුතු වලට වර්තමානය වන විට බහුලව සම්බන්ධ වී කටයුතු කරයි (Wickramasinghe, 2010). එසේම, මෙරට ප්‍රතිපත්ති සම්පාදනය හා පාලනය සම්බන්ධයෙන් දේශපාලන නායකත්වයක් ලෙස කාන්තාවන්ගේ විශාල බලපෑමක් ඇතිබව පර්යේෂණ මඟින් ඉදිරිපත් කොට ඇත (De Mel, 2011).

ශ්‍රී ලංකාවේ කාන්තා නියෝජනයේ වත්මන් තත්ත්වය සැලකීමේදී ජනාධිපතිවරයාගෙන් හා පාර්ලිමේන්තුවෙන් සැදුම්ලත් ජාතික මට්ටම, පළාත් සභා නවයකින් සමන්විත පළාත් මට්ටම සහ ප්‍රාදේශීය පරිපාලන ආයතන 335 කින් සමන්විත ප්‍රාදේශීය මට්ටම ආදී ආයතන වල පවතින විවිධ බාධාවන් හේතුවෙන් කාන්තාවන්ගේ අඩු නියෝජනය එක් එක් මට්ටමින් සිදුවේ. නිදසුන් වශයෙන්, සමානුපාතික නියෝජන ක්‍රමයක් තිබියදීත්, පාර්ලිමේන්තුවේ කාන්තා නියෝජනය 5.3% කි. එනම් 225 න් 12 ක් කාන්තාවන් වන අතර කිසිවෙකු දෙමළ හෝ මුස්ලිම් ප්‍රජාව නියෝජනය නොකරයි. මීට අමතරව, වර්තමාන ආණ්ඩුව තුළ කාන්තා නියෝජනය වෙනුවෙන් පත් කර ඇත්තේ එක් කැබිනට් අමාත්‍යවරියක් හා රාජ්‍ය අමාත්‍යවරියන් දෙදෙනෙකු පමණි (presidential secretariat, 2023). එසේම, පළාත් සභා මන්ත්‍රී ධුරවලින් 5% කට වඩා අඩු ප්‍රමාණයක් කාන්තාවන් සතු වන අතර කෝටාවක් ලබා දෙන නව නීති රාමුව තවමත් ක්‍රියාත්මක නොවන අතර පවතින මැතිවරණ ක්‍රමය සහ පළාත් සභා මැතිවරණ පැවැත්වීම තවමත් අවිනිශ්චිතව පවතී.

විශ්වවිද්‍යාල උපාධි ප්‍රමාණය ඉහළ යාම, ආර්ථික අවස්ථා හෝ සිවිල් සමාජ සංවිධානවල නායකත්ව තනතුරු ලබා ගැනීම තුළින් ශ්‍රී ලාංකේය කාන්තා ප්‍රගතිය පිළිබඳ සාක්ෂි පිළිබිඹු කළ ද දේශපාලන නායකයින් ලෙස ඔවුන්ගේ නියෝජනයේ වැඩිවීමක් පෙන්නුම් නොකරයි. ගුණසේකර (2013) ට අනුව සංස්කෘතික සම්මතයන්, සම්පත් සඳහා වූ සීමිත ප්‍රවේශය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ වෙනස්කම් සිදු කිරීම ඇතුළු දේශපාලන සහභාගීත්ව සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ කාන්තාවන් මුහුණ දේන විවිධ බාධක හා අභියෝග ඉස්මතු කර දක්වයි.

ශ්‍රී ලංකාවේ දේශපාලන තනතුරු සඳහා තරඟ කිරීමේදී කාන්තාවන් මුහුණ දෙන ප්‍රධාන බාධක අතරට දේශපාලන පක්ෂ රාමු තුළ විනිවිදභාවයක් නොමැතිකම නිසා කාන්තාවන්ට අවාසිදායක තත්ත්ව නිර්මාණය වීම, ජනමාධ්‍ය තුළ කාන්තාවන්ට වෙනස් ලෙස සැලකීම හා කාන්තා අපේක්ෂකයින් පිළිබඳ අඩු ප්‍රවෘත්ති ආවරණයක් ලබා දීම දැක්විය හැකිය. මීට අමතරව, මැතිවරණවලදී කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය හා කාන්තා අපේක්ෂකයින් ආරක්ෂා කිරීම සඳහා ව්‍යුහයන් සහ යාන්ත්‍රණ නොමැතිකම ද ප්‍රධාන බාධක ලෙස හඳුනා ගත හැකිය (IFES, 2022). කාන්තාවන්ගේ දේශපාලන කටයුතු වඩාත් ඵලදායි ලෙස ප්‍රවර්ධනය කිරීමට සහ එසේ කිරීමෙන් ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමට මැතිවරණ සහ ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ සාකච්ඡාවලදී කාන්තා හඬට ප්‍රමුඛත්වය ලබා දීම, තේරී පත් වූ කාන්තාවන් සඳහා ව්‍යවස්ථාදායක ආයතන සහ දේශපාලන පක්ෂ තුළ ඔවුන්ගේ දායකත්වයට සවන් දීම සහ අගය කිරීම, කාන්තාවන්ට එරෙහි මැතිවරණ ප්‍රචණ්ඩත්වය අවම කිරීම ආදී පිළිවෙත් යොදාගත හැකිය.

## ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය

ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය ලෝකයේ වඩාත්ම ප්‍රචලිත මානව හිමිකම් කඩකිරීම් වලින් එකකි. මෙම ප්‍රචණ්ඩත්වය එහි වින්දිතයන්ගේ සෞඛ්‍යය, ගෞරවය, ආරක්ෂාව සහ ස්වාධීනත්වය අඩපණ කරයි, නමුත් එය නිහඬ සංස්කෘතියකින් වැසී පවතී.

ශ්‍රී ලංකාවේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය (Gender Based Violence) සහ කාන්තාවන්ට එරෙහි හිංසනය ඉතා අඩු අවධානයට ලක්ව ඇති බරපතල ගැටළු වේ. ශ්‍රී ලංකාවේ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තු වේ කාන්තා සුබසාධන සමීක්ෂණයේ 2019 වසරේදී දිවයිනේ දිස්ත්‍රික්ක 25ම ආවරණය කරමින් සිදු කරන ලදී. එහිදී වයස අවුරුදු 15 සහ ඊට වැඩි කාන්තාවන් 2,264ක් සම්මුඛ සාකච්ඡා කර ඇත. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය කාන්තාවන්ගේ සහ ගැහැණු ළමයින්ගේ ප්‍රගතියට සහ යහපැවැත්මට බලපාන මානව හිමිකම් උල්ලංඝනයන්ගෙන් එකක් බව එය සනාථ කරයි (Maduwage, 2020). සමස්තයක් වශයෙන්, ශ්‍රී ලංකාවේ කාන්තාවන් හතරෙන් එකක් (24.9%) සහකරුවෙකු හෝ හවුල්කරුවෙකු නොවන අයෙකු විසින් කායික සහ/හෝ ලිංගික හිංසනය අත්විඳ ඇති බව එම වාර්තාව අනාවරණය කරයි. මේ අතර, සෑම කාන්තාවන් පස් දෙනෙකුගෙන්ම දෙදෙනෙකු (39.8%) ශාරීරික, ලිංගික, චිත්තවේගීය සහ/හෝ ආර්ථික ප්‍රචණ්ඩත්වයට සහ/හෝ හවුල්කරුවෙකු විසින් පාලනය කරන හැසිරීම් වලට ගොදුරු වී ඇත. කායික ප්‍රචණ්ඩත්වය වැඩි වශයෙන් වාර්තා වූයේ වතුකරයේ ය. වතුවල ජීවත් වන කාන්තාවන්ගෙන් තුනෙන් එකකට (37.9%) වැඩි ප්‍රමාණයක් ඔවුන්ගේ ජීවිත කාලය තුළ ශාරීරික හිංසනයට මුහුණ දී ඇත (Maduwage, 2020). ශ්‍රී ලාංකේය සංස්කෘතිය

පවුල හා සමාජය තුළ මාතෘත්වයට ගෞරවනීය ස්ථානයක් හිමිවන බව නියම කළද ශ්‍රී ලංකාවේ කාන්තාවන් විශාල පිරිසකට නිවස හා සමාජය ආරක්ෂිත පරිසරයක් නොවන බව පෙනේ.

කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වයේ ව්‍යාප්තිය මැඩලීමට බොහෝ දේ සිදු කර නොමැති ප්‍රධාන හේතුවක් වන්නේ ශ්‍රී ලාංකීය සමාජයේ එම ප්‍රශ්නය සම්බන්ධයෙන් දක්වන ආකල්පයි. පුරුෂයා තම ප්‍රධානියා බවත්, හොඳ බිරිඳක් කිසිදු ප්‍රශ්න කිරීමකින් තොරව තම ස්වාමිපුරුෂයාට කීකරු වන බවත්, කාන්තාවන් ඔවුන්ට අවශ්‍ය නොවන විට පවා තම ස්වාමිපුරුෂයා සමඟ ලිංගිකව හැසිරීමට බැඳී සිටින බවත්, පිරිමින්ට තම බිරිඳට පහර දීමට ඕනෑම අවස්ථාවක හැකි බවත් ආදී වූ ශ්‍රී ලාංකේය සමාජය පාලනය කරන ගැඹුරින් මුල් බැසගත් ලිංගිකත්වය, අභ්‍යන්තර ස්ත්‍රී ද්‍රෝහීත්වය සහ පුරුෂාධිපත්‍ය මත පදනම් වූ සංස්කෘතික දුර්මත මතයන් නිසා බොහෝ පිරිසක් කාන්තා හිංසනය ගැටලුවක් ලෙස නොදකියි. ගැහැනු ළමයින්ට සහ කාන්තාවන්ට කුඩා කාලයේ සිටම උගන්වනු ලබන්නේ පිරිමින් තමන්ට වඩා උසස් බවත් හොඳ බිරිඳකගේ කාර්යභාරය තම ස්වාමිපුරුෂයාට යටත්ව සිටීම බවත් එබැවින් සමීප සහකරුවන් හෝ පිරිමි පවුලේ සාමාජිකයන් විසින් කාන්තාවන්ට එරෙහි හිංසනය පිළිගත හැකි බවත් පවුල් ජීවිතයේ සාමාන්‍ය කොටසක් බවත් ඔවුන් විශ්වාස කරයි.

ඔවුන් එය ගැටලුවක් ලෙස නොදකින බැවින් තමන්ට හෝ තමන් අවට සිටින කාන්තාවන්ට සිදු වූ මෙවැනි හිංසනයන්ට එරෙහිව ක්‍රියාමාර්ගයක් නොගනිති. මෙය කාන්තාවන්ට එරෙහි හිංසනය ඉවසීමේ සහ පිළිගැනීමේ සංස්කෘතියක් ඇති කිරීමට හේතු වී තිබේ. මේ නිසා ප්‍රචණ්ඩත්වය අත්විඳින හෝ අත්විඳින බොහෝ කාන්තාවන් උපකාර පතනවාට වඩා නිහඬව දුක් විඳියි. කාන්තාවන්ට කිසිදු උපකාරයක් නොමැතිව නිශ්ශබ්දව ඔවුන්ගේ දුක් වේදනා විඳ දරාගැනීමට බලකිරීමට ශ්‍රී ලංකාවේ කාන්තාවන්ගේ ඉවසීමේ සංස්කෘතිය සහ කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය කෙතරම් දැඩි ලෙස දායක වේද යන්න මෙයින් ඉස්මතු කරයි. කෙසේවෙතත්, වින්දිතයන් ප්‍රචණ්ඩත්වයේ අවස්ථා වාර්තා කිරීමට පසුබට වන්නේ, ඔවුන් ආරක්ෂා කිරීමේ සහ අපරාධකරුවන්ට දඬුවම් කිරීමේ අධිකරණ පද්ධතිය කෙරෙහි විශ්වාසයක් නොමැති බැවිනි. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය සම්බන්ධයෙන් ශ්‍රී ලාංකේය සමාජයේ ආකල්පය ගවේෂණය කිරීමේදී උසස් අධ්‍යාපනයක් ලබා ඇති කාන්තාවන්ට අධ්‍යාපනයක් නොමැති හෝ අඩු මට්ටම් ඇති අය හා සසඳන විට ප්‍රචණ්ඩත්වය ඉවසා සිටීමේ හැකියාව අඩු බව පර්යේෂණ මගින් සොයා ගෙන ඇත (Maduwage, 2020). කාන්තා හිංසනය පිටුදැකීම සඳහා අධ්‍යාපනය වැදගත් කාර්යභාරයක් ඉටු කරන බව මින් පැහැදිලි වේ.

ගෘහස්ත ප්‍රචණ්ඩත්වය හා හිරිහැර ඇතුළු ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය ශ්‍රී ලංකාව තුළ ප්‍රබල ප්‍රශ්නයකි. නෛතික රාමු හා උපකාරක සේවා ස්ථාපිත කර තිබුණද ඒවා ක්‍රියාත්මක කිරීමේ හා දැනුවත් කිරීමේදී අභියෝග පවතී. ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය පිළිබඳ සංකීර්ණ ගැටලු, එහි ව්‍යාප්තිය හා එය සිදුවන සමාජ-සංස්කෘතික හා නීතිමය සන්දර්භයන් පිළිබඳව මෙන්ම ස්ත්‍රීපුරුෂ සමානාත්මතාවය සාක්ෂාත් කර ගැනීමට කාන්තාවන්ට ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳව ද නිසි පිළිවෙතක් නොමැත (De Mel, 2005).

## LGBTQ ප්‍රජාවන්

ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංකල්පය බොහෝ විට පුද්ගලයෙකුගේ ස්වයං-හඳුනාගැනීම සහ ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ පෞද්ගලික අත්දැකීම් සමඟ සම්බන්ධ වී ඇති අතර එයට සංස්කෘතික, සමාජීය සහ මනෝවිද්‍යාත්මක සාධක බලපායි. ශ්‍රී ලංකාව තුළ සාම්ප්‍රදායික විශ්වාසයන් සහ සමාජ සම්මතයන් සාමාන්‍යයෙන් ගතානුගතික වී ඇති අතර, ස්ත්‍රී පුරුෂ-ද්විමය රාමු තුළ විෂමලිංගික සබඳතා අවධාරණය කිරීම සංස්කෘතික රාමුවට පරිබාහිර දෙයක් ලෙස සළකයි. ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික ස්ත්‍රී පුරුෂ අනන්‍යතාවය පිරිමි සහ ගැහැණු යන ද්විමය ආකෘතියට සීමා නොවී වර්තමානය වන විටතරුණ පරම්පරාව මෙම ද්විමය ආකෘතියට අභියෝග කරමින් නව ලිංගික ප්‍රවණතා වෙත යොමු වී ඇති බව පෙනේ. ශ්‍රී ලංකාවේ LGBTQ (Lesbian, Gay, Bisexual, Transgender, and Queer) ප්‍රජාවන් සමාජය තුළ ජීවත් වන අතර ඔවුන්ගේ අද්විතීය සංස්කෘතික භාවිතයන් පවත්වා ගෙන යනු ලබයි. ස්ත්‍රී පුරුෂ භාවය සහ ලිංගිකත්වය පිළිබඳ සංස්කෘතික සම්මතයන් සහ සමාජ අපේක්ෂාවන් තුළ මුල් බැස හිඳිමින් ශ්‍රී ලංකාවේ LGBTQ පුද්ගලයන් සමාජය තුළ කොන් කිරීම සහ වෙනස් කොට සැලකීම ඇතුළු සැලකිය යුතු අභියෝගවලට මුහුණ දෙයි. ආගමේ ප්‍රබල බලපෑම, ප්‍රචලිත පක්ෂග්‍රාහීත්වය සහ නීතිමය රැකවරණයක් නොමැතිකම නිසා LGBTQ

පුද්ගලයන් තම ස්ත්‍රී පුරුභාවය තහවුරු කර ගැනීමේදී සහ පුළුල් සමාජය තුළ අර්ථවත් සබඳතා පැවැත්වීමේදී මුහුණ දෙන අරගල වඩාත් උග්‍ර වේ.

ශ්‍රී ලංකාවේ LGBTQ සමාජ තුළ, වර්තමානය වනවිට පුද්ගලයන් බොහෝ විට සාම්ප්‍රදායික ස්ත්‍රී පුරුෂ භූමිකාවන් ප්‍රශ්න කරන හෝ අභිබවා යන ආකාරයෙන් ඔවුන්ගේ ස්ත්‍රී පුරුෂ අනන්‍යතාවය සාකච්ඡා කර ගොඩනගා ගෙන ඇතිබව පෙනේ. මේ සඳහා අන්තර්ජාල හා සමාජ මාධ්‍ය බහුල ලෙසම ඔවුන් භාවිතයට ගනු ලබයි. විවිධ ලිංග ප්‍රකාශන හරහා ද්විමය ස්ත්‍රී පුරුෂ කාණ්ඩවල සීමාවන් ඔවුන් විසින්ම අභියෝගයට ලක් කර ඇති බව පෙනේ. උදාහරණ ලෙස ප්‍රසිද්ධ මාධ්‍යයට පැමිණ තමන්ගේ විෂම ලිංගිකත්වය පිළිබඳ කතාව හා තමන් මුහුණ දුන් සමාජ අභියෝග හා ඒවා ජයගත් ආකාරය පිළිබඳව සමාජගත කිරීම එලෙස තමන්වම අභියෝගයට ලක් කර ගත් අවස්ථාවකි. ශ්‍රී ලංකාවේ LGBTQ ප්‍රජාවන් සමාජීය අභියෝගවලට සැරිසැරීමට සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අනන්‍යතා ගවේෂණය සඳහා උපකාරක සමාජ පද්ධති නිර්මාණය කර ඇත. ඒවා පුද්ගලයන්ට අර්ථවත් සබඳතා ඇති කර ගැනීමට සහ අත්දැකීම් බෙදා ගැනීමට සහාය ලබා දෙයි. කෙසේ වෙතත්, පවතින සංස්කෘතික හා ආගමික සම්මතයන් හේතුවෙන් ප්‍රධාන ධාරාවේ සමාජයෙන් ඔවුන්ට එන ප්‍රතිරෝධයට ද ඔවුන් සාර්ථකව මුහුණ දෙන බව පෙනේ. ශ්‍රී ලංකාවේ LGBTQ සමාජ තුළ ස්ත්‍රී පුරුෂ සමාජභාවය, සමාජ-ආර්ථික තත්ත්වය, කුලය, ආගම සහ වාර්ගිකත්වය යන මානයන් මානව විද්‍යාත්මක අධ්‍යයන තුළින් අනාවරණය වේ. මෙම බහුවිධ අනන්‍යතා පුද්ගලයන් තම ලිංගභේද භූමිකාවන් සහ සබඳතා සාකච්ඡා කරන ආකාරය කෙරෙහි බලපායි. එපමණක් නොව, මෙම පුද්ගලයන්ට සරිලන පරිසරයක් නිර්මාණය කිරීම සඳහා නීතිමය ආරක්ෂාව, දැනුවත්භාවය සහ විවිධ ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳ ප්‍රකාශන පිළිගැනීම ඇතුළු සමාජ වෙනසක අවශ්‍යතාවය එය අවධාරණය කරයි. LGBTQ ප්‍රජාවන්ගේ අද්විතීය අත්දැකීම් අවබෝධ කර ගැනීමෙන් සහ අගය කිරීමෙන්, ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ විවිධත්වය සමරන වඩාත් සාධාරණ සහ ඉවසිලිවන්ත සමාජයකට අපට දායක විය හැක.

සමලිංගික හෝ සංක්‍රාන්තික ලිංගික සබඳතා පවත්වන LGBTQ ප්‍රජාවේ කොටසක් ලෙස හඳුනාගෙන සිටින කාන්තාවන්ට එරෙහි හිංසන අවස්ථා පිළිබඳව විශේෂයෙන් සළකා නොබැලේ. ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ වැඩිහිටියන් අතර පවතින සමලිංගික ලිංගික සබඳතා අපරාධයක් ලෙස සලකන බැවින්, රජයේ බලධාරීන් මෙම ප්‍රජාව මුහුණ දෙන ගැටළු සම්බන්ධයෙන් අවධානය යොමු නොකරයි. එකම ලිංගයේ සහකරුවන් අතර ගෘහස්ථ අපයෝජන සහ ප්‍රචණ්ඩත්වය සිදුවිය නොහැකි බවට ප්‍රචලිත මිථ්‍යාවක් ද සමාජය තුළ තිබේ. කෙසේ වෙතත්, සම කණ්ඩායම් විසින් රැස් කරන ලද උපකල්පිත සාක්ෂි පෙන්නුම් කරන්නේ LGBTQ ප්‍රජාවට, විශේෂයෙන් LBTQ (Lesbian, Bisexual, Transgender and Queer) කාන්තාවන්ට එරෙහිව සිදු කරන ලද ප්‍රචණ්ඩත්වය ඉහළ මට්ටමක පවතින බවයි (Maduwage, 2020). ඔවුන්ගේ ලිංගභේදය සහ ඔවුන්ගේ ලිංගික දිශානතිය හේතුවෙන් ඔවුන් සෑම අතකින්ම කොන් වීමකට භාජනය වී ඇත. මෙයින් අදහස් කරන්නේ ප්‍රචණ්ඩත්වය සහ ගෘහස්ථ අපයෝජනය සම්බන්ධයෙන් ගත් කල, ඔවුන් දැඩි සේ ප්‍රචණ්ඩත්වයට ලක් වන බවයි. තම සහකරු හෝ සහකරු නොවන අයගේ ප්‍රචණ්ඩත්වය හැරුණු විට, LBTQ කාන්තාවන්ට ඔවුන්ගේ පවුල් විසින් විෂමලිංගික විවාහවලට බලකිරීමේ අභියෝගයටද මුහුණ දෙයි. මෙම ගැටලුව සම්බන්ධයෙන් පර්යේෂණ සොයාගැනීම් නොමැති වුවද, කාන්තාවන්ට එරෙහි හිංසනය බහුල වීම හේතුවෙන් LBTQ කාන්තාවන් විශාල වශයෙන් දුක් විඳින බව පැහැදිලිය.

**සමාලෝචනය**

ශ්‍රී ලංකාවේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ මෙම මානව විද්‍යාත්මක ගවේෂණය සංස්කෘතිය, ඉතිහාසය සහ සමකාලීන අභියෝගවල සංකීර්ණ අන්තර් ක්‍රියාකාරිත්වය ඉස්මතු කරයි. සාම්ප්‍රදායික ස්ත්‍රී පුරුෂ භූමිකාවන් ජීවිතයේ බොහෝ පැතිවල පවතින අතර, ශ්‍රී ලංකාව වඩාත් සාධාරණ ස්ත්‍රී පුරුෂ සම්බන්ධතා වෙත ක්‍රමානුකූලව මාරුවීමක් වර්තමානය වන විට අත්විඳිමින් සිටී. ශ්‍රී ලංකාවේ ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ සංකීර්ණතා අවබෝධ කරගැනීම, සමාජ අසමානතා ආමන්ත්‍රණය කිරීම සහ සමාජය පෝෂණය කිරීම සඳහා අත්‍යවශ්‍ය වේ. මානව විද්‍යාව, ශ්‍රී ලංකාවේ ස්ත්‍රී පුරුෂ භාවයේ විකාශනය වන ගතිකත්වයන් පිළිබඳව අඛණ්ඩව අධ්‍යයනය කරන බැවින්, ස්ත්‍රී පුරුෂ භාවය යනු ස්ථිතික සංකල්පයක් නොව නිරන්තරයෙන් වෙනස් වන්නක් බව පැහැදිලිවම පෙනේ.

අධ්‍යාපනය සහ රැකියාව වැනි ක්ෂේත්‍රවල පූර්ණ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සාක්ෂාත් කර ගැනීමේ අභියෝග පවතී. අධ්‍යාපනික ප්‍රවේශයේ විෂමතා ආමන්ත්‍රණය කිරීම, නිපුණතා සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සහ ශ්‍රම බලකායේ කාන්තා පූර්ණ සහභාගීත්වයට ඇති බාධක වලට අභියෝග කිරීම තීරණාත්මක පියවරයන් වේ. අඛණ්ඩ පර්යේෂණ සහ ප්‍රතිපත්ති මුලපිරීම් ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ සහ රැකියා ක්ෂේත්‍රයේ ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ ගතිකත්වයේ අනාගතය හැඩගැස්වීම සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ඇත. මෑත වසරවලදී, ශ්‍රී ලංකාව කාන්තාවන් සඳහා අධ්‍යාපනය සහ දේශපාලන නියෝජනය වැනි ක්ෂේත්‍රවල කැපී පෙනෙන ප්‍රගතියක් අත්කර ගෙන ඇත. කෙසේ වෙතත්, ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය, ආර්ථික විෂමතා සහ නායකත්ව භූමිකාවන්හි අඩු නියෝජනය ඇතුළු සැලකිය යුතු අභියෝග දිගටම පවතී. මෙම අභියෝග පුළුල් සමාජ සම්මතයන් සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය අඛණ්ඩව හැඩගස්වන ව්‍යුහාත්මක අසමානතා පිළිබිඹු කරයි. ශ්‍රී ලංකාව තුළ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ප්‍රවර්ධනය කිරීමට සහ වඩාත් ගුණාත්මක සමාජයක් නිර්මාණය කිරීමට අඛණ්ඩ අන්තර් විනය පර්යේෂණ සහ විද්වතුන්, සිවිල් සමාජය සහ ප්‍රතිපත්ති සම්පාදකයින් අතර සහයෝගීතාවය, ප්‍රතිපත්ති මුලපිරීම් සහ ප්‍රජා මූලික උත්සාහයන් අත්‍යවශ්‍ය වේ.

ස්ත්‍රී පුරුෂ සමාජභාවයේ අසමානතාවයන් තවදුරටත් උග්‍ර කළ ගෝලීය COVID-19 වසංගතයේ සෘණාත්මක බලපෑම් වැනි අනෙකුත් මෑත ප්‍රවණතා සමඟ ඒකාබද්ධ වූ කාන්තාවන්ගේ මෙම සෑම අංශයකම අඛණ්ඩ අඩු නියෝජනය කිසියම් ඉලක්කගත පිළිවෙතක අවශ්‍යතාවය අවධාරණය කරයි. COVID-19 ජීවිතාරක්ෂක ලිංගික සහ ප්‍රජනක සෞඛ්‍ය සේවා සඳහා ප්‍රවේශය දැඩි ලෙස කඩාකප්පල් වූ අතර කාන්තාවන්ට සහ ගැහැණු ළමයින්ට මෙම සේවාවන් වඩාත් අවශ්‍ය වන මොහොතක ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වයට ප්‍රතිචාර දැක්වීමට බලධාරීන්ට ඇති හැකියාව අභියෝගයට ලක් කර ඇත. කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් සහ ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් සහ අධ්‍යාපන සේවා, පවුල් සෞඛ්‍ය කාර්යාංශය, මිතුරු පියස සහ තවත් රාජ්‍ය, පෞද්ගලික අංශයේ සහ රාජ්‍ය නොවන ආයතන සෑම එකක්ම පාහේ මෙම අභියෝග සඳහා පිළිතුරු ලබාදීමට කටයුතු කිරීම වැදගත් වේ. ශ්‍රී ලංකාවේ නීති පද්ධති මේ වන විට කාන්තාවන් ප්‍රචණ්ඩත්වයට මුහුණ දීමෙන් ආරක්ෂා කිරීමට සහ ආරක්ෂා කිරීමට අපොහොසත් වී ඇතත් තවදුරටත් මෙම ගැටලුව හංගා දැමිය නොහැක. වර්තමාන සාක්ෂි පෙන්නුම් කරන්නේ මෙම ප්‍රශ්නය වඩාත් නරක අතට හැරෙමින් පවතින බවයි. එබැවින්, අපරාධකරුවන් නීතිය හමුවට පමුණුවා, ප්‍රචණ්ඩත්වයෙන් තොර ජීවිතයක් සඳහා කාන්තාවන්ට ඇති අයිතිය හඳුනා ගැනීමටත් එමගින් කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය පිටුදැකීමටත් කාන්තාවන් සවිබල ගැන්වීමට බලධාරීන් තීරණාත්මක පියවර ගත යුතු කාලය එළඹ ඇත.

මානව විද්‍යාත්මක දෘෂ්ටිකෝණයකින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය අධ්‍යයනය කිරීමෙන්, පර්යේෂකයන් අරමුණු කරන්නේ ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ අත්‍යවශ්‍ය සංකල්පවලට අභියෝග කිරීම, ස්ත්‍රී පුරුෂ සමාජභාවය ගොඩනැගීම් කෙරෙහි සමාජ හා සංස්කෘතික බලපෑම් ඉස්මතු කිරීම සහ විවිධ සමාජ තුළ ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ වඩාත් සියුම් අවබෝධය සඳහා දායක වීමයි.

**ආශ්‍රිත ග්‍රන්ථ**


Butler, J. (1990). *Gender Trouble: Feminism and the Subversion of Identity*. Routledge.

Connell, R. W. (1987). *Gender and power: Society, the person, and sexual politics.* Stanford University Press.

De Alwis, M. M. (2006). Negotiating Violence against Women: Critical Crossroads of Human Rights and Cultural Values in Sri Lanka. *Gender & Society*, 20(4), pp. 483-507.

De Mel, N. (2005) Gender, Conflict and Development in Sri Lanka: A Review of Research, *Gender and Development*, 13(1), pp. 45-57. DOI: 10.1080/13552070512331332239

De Mel, N. (2011). *Women and Governance in Sri Lanka: An Overview. In A New Era for Democratic Governance in Sri Lanka*. Colombo: Friedrich-Ebert-Stiftung.

De Silva, P., & Punchihewa, A. (2011). *Socio-Anthropological Research Project on Vedda Community in Sri Lanka*. University of Colombo.

De Soysa, S. (1998). Transformation of the family, an agenda for reform: the Sri Lankan experience, *Sri Lanka Journal of Social Science*, 21 (1&2) pp. 83-104.

Fenstermaker, S., & West, C. (2002). *Doing gender, doing difference: Inequality, power, and institutional change.* Routledge.

Gunawardena, N. (2015). *The Impact of Gender Quotas on Women's Political Representation in Sri Lanka: A Critical Appraisal. In Routledge Handbook of Gender in South Asia*, pp. 288-298). Routledge.

International Foundation for Electoral Systems. (2022 April). *Women's Political Representation in Sri Lanka: Electoral System Analysis and Recommendations.* International Foundation for Electoral Systems Organization. https://www.ifes.org/publications/womens-political-representation-sri-lanka-electoral-system-analysis-and

Jayatilleke, A. C. (2014). Violence against Women in Sri Lanka: A Literature Review. *Violence against Women*, 20(11), pp. 1331-1352.

Jayawardena, K. (1995). *The White Woman's Other Burden Western Women and South Asia During British Rule* (1st ed.). Routledge.

Jayaweera, S. (2000). *Women in Sri Lanka: A Long Struggle to Enter Politics.* Kali for Women.

Maduwage, S. (2020, December) Violence against women in Sri Lanka. *Daily FT.* https://www.ft.lk/columns/Violence-against-women-in-Sri-Lanka/4-710091

Obeyesekere, G., & Gombrich, R. (1989). *Buddhism Transformed: Religious Change in Sri Lanka. Princeton*. Princeton University Press.

Solotaroff, J. L., Joseph, G., Kuriakose, A.T., & Sethi, J. (2020). *Getting to Work: Unlocking Women's Potential in Sri Lanka's Labor Force.* Directions in Development. Washington, DC: World Bank. doi: 10.1596/978-1-4648-1067-1.

Wanigasinghe, L. (2022, March 08). Breaking the Bias: Increasing Women's Political Participation in Sri Lanka. *Institute of Policy Studies.* https://www.ips.lk/talkingeconomics/2022/03/08/breaking-the-bias-increasing-womens-political-participation-in-sri-lanka/

Wickramasinghe, M. (2010). Women in Post-Independence Sri Lanka: The Women's Movement and Women's Activism, 1948–1988. *South Asia: Journal of South Asian Studies*, 33(4), pp. 563-587.